සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.07.28

Learning Resource Centre
R
De Mazenod Coll.
Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

18601

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

උපදෙස් :-
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1) ජනතාව විසින් ඔවුන්ගේ පාලනය සඳහා පවත්වාගෙන යනු ලබන පාලන ක්‍රමය

i. සමාජවාදයයි. ii. ඒකාධිපතිවාදයයි. iii. ප්‍රජාතන්ත්‍රවාදයයි. iv. ධනවාදයයි.

2) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ වයස් සීමාව වන්නේ

i. අවුරුදු 16 සම්පූර්ණ කර තිබීම ය.
ii. අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම ය.
iii. අවුරුදු 21 සම්පූර්ණ කර තිබීම ය.
iv. අවුරුදු 22 සම්පූර්ණ කර තිබීම ය.

3) ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,

i. පරමාධිපත්‍ය බලය නමිනි.
ii. සර්වජන ඡන්ද බලය නමිනි.
iii. නීත්‍යානුකූල බලය නමිනි.
iv. නීතියේ ආධිපත්‍ය බලය නමිනි.

4) ව්‍යවස්ථාදායකය නමින් පනවන නීති ක්‍රියාවට නැංවීමේදි පැන නගින ගැටළු නිරාකරණය කරනු ලබන ආයතනය වන්නේ

i. විධායකය මගිනි. ii. අධිකරණය මගිනි. iii. පාර්ලිමේන්තුව මගිනි. iv. ආණ්ඩුව මගිනි.

5) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය කුමක්ද?

i. උඩරට නීතිය
ii. අපරාධ නීතිය
iii. රෝම ලන්දේසි නීතිය
iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය

6) සන්ධිය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?

i. බලතල නැවත පවරාගත හැකිවීමයි.
ii. එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම.
iii. ව්‍යවස්ථාදායකය, විධායක, අධිකරණය බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් වෙත පැවරීම.
iv. බලය විමධ්‍යගතකර තිබීම.

7) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් තුළ විධායකය තේරිපත් වන්නේ පහත කුමන ආකාරයකටද?

i. සෘජුවම මහජන ඡන්දය මගිනි.
ii. පාර්ලිමේන්තුවට තේරිපත් වන නියෝජිතයන්ගෙනි.
iii. සම්පූර්ණයෙන්ම ජනාධිපතිවරයා විසින් කැමති මණ්ඩලයක් මගිනි.
iv. නාමික විධායකය ලෙස කටයුතු කරන රජු හා රැජින මගිනි.

8) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුවකට එරෙහිව මහා බ්‍රිතාන්‍යයේ රාජාධිකරණයට අභියාචනය කිරීමේ අයිතිය අවලංගු කරන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද?

i. පළමු ජනරජ ව්‍යවස්ථාවෙනි.
ii. සෝල්බරි ව්‍යවස්ථාවෙනි.
iii. ඩොනමෝර් ව්‍යවස්ථාවෙනි.
iv. දෙවන ජනරජ ව්‍යවස්ථාවෙනි.

9) පරිසරය සම්බන්ධයෙන් පුරවැසියෙකු සතු යුතුකමක් වන්නේ

i. සිය පරිභෝජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් භාවිතා කිරීම ය.
ii. තමාගේ අභිවෘද්ධිය සඳහා සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම ය.
iii. තම බුද්ධිය යොදවා තම සම්පත් ගවේෂණය කිරීම ය.
iv. පරිසරයේ සම්පත් අරපිරි මැස්මෙන්භාවිත කිරීම ය.

10) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා ලෙස කටයුතු කරන්නේ

i. අගවිනිසුරුවරයා ය.
ii. ජනාධිපතිවරයා ය.
iii. නීතිපතිවරයා ය.
iv. අධිකරණ ඇමතිවරයා ය.

11) ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම

i. දේශපාලන පක්ෂ මගින් ඉටු කළයුතු කාර්යයකි.
ii. නිදහස් ජන මාධ්‍ය මගින් ඉටු කළයුතු කාර්යයකි.
iii. සමාජ සංවිධාන මගින් ඉටු කළයුතු කාර්යයකි.
iv. බලපෑම් කණ්ඩායම් මගින් ඉටු කළයුතු කාර්යයකි.

12) පළාත් සභාවක පරිපාලන බලතල පිළිබඳ අවසාන අධිකාරි බලය හිමිවන්නේ

i. පළාත් ආණ්ඩුකාරවරයාට ය.
ii. අගමැතිවරයාට ය.
iii. මහ ඇමතිට ය.
iv. පරිපාලන නිලධාරියාට ය.

13) ශ්‍රේෂ්ඨාධිකරණය හැරුණු විට පවතින අනෙක් ජ්‍යෙෂ්ඨ අධිකරණය වන්නේ

i. මහාධිකරණයයි.
ii. මහේස්ත්‍රාත් අධිකරණයයි.
iii. දිසා අධිකරණයයි.
iv. අභියාචනාධිකරණයයි.

14) පුද්ගලයන් තුළ යම් භාණ්ඩයක් හෝ සේවාවක් මිලට ගැනීමට පෙළඹවීම කෙරෙහි වැඩිම බලපෑමක් සිදුවන සාධකය වන්නේ

i අවශ්‍යතා ii. ආදායම iii. පරිසරය iv. ප්‍රචාරණය

15) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූපයක් ඇතුළත් පිළිතුර කුමක්ද?

i යුධ උපාය සම්බන්ධතා
ii. සංස්කෘතික උපාය සම්බන්ධතා
iii. දේශපාලන උපාය සම්බන්ධතා
iv. ආගමික උපාය සම්බන්ධතා

16) ශ්‍රී ලංකාවේ වසර 30ක් පමණ පැවති ජන වාර්ගික ගැටුම අයත් වන්නේ කුමන ගැටුම් වර්ගයටද?

i. ආගමික ගැටුම්
ii. ආර්ථික ගැටුම්
iii. සමාජ ගැටුම්
iv. පුද්ගල ගැටුම්

17) සංවර්ධන ක්‍රියාවලියේදී මුහුණුපාන ගැටළු විසඳා ගැනීමට රටකට ගතහැකි වඩාත් ඵලදායි ක්‍රියාමාර්ගයක් වන්නේ

i. බුද්ධිගලනය දිරිගැන්වීමයි
ii. විදේශ ණය ආධාර ගැනීමයි
iii. අපනයනය විවිධාංගීකරණයයි
iv. ශ්‍රම හමුදාව ගෙන්වා ගැනීමයි

18) මුස්ලිම් දික්කසාද හා විවාහ සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පිහිටුවා ඇති උසාවි වර්ගය කුමක්ද?

i. අභියාචනාධිකරණයයි.
ii. කාති උසාවියයි.
iii. කම්කරු විනිශ්චය සභාවයි.
iv. ගෙවල් කුලී මණ්ඩලයයි.

19) ප්‍රජාතන්ත්‍රවාදී රටක සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු ඉටුකළ යුතු නීතිමය යුතුකමක් වන්නේ

i. පරිසරය සුරැකීම ය.
ii. ගුරුවරුන්ට සැලකීම ය.
iii. අයබදු ගෙවීම ය.
iv. දෙමාපියන්ට සැලකීම ය.

20) ශ්‍රී ලංකාවේ ජනවර්ග අතරට දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනතාව ඇතුලත් වීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ

i බ්‍රිතාන්‍ය පාලන සමයේ වතුවගාව සඳහා දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනතාව ගෙන්වා ගැනීම.
ii. ලන්දේසි පාලන සමයේ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනතාව ගෙන්වා ගැනීම.
iii. පෘතුගීසි පාලන කාලයේ අවුමිල්දාවරුන් ලෙස පැමිණි පිරිස නිසාය.
iv. ශ්‍රී ලංකාව නිතර නිතර දකුණු ඉන්දීය ආක්‍රමණවලට ලක්වීම.

21) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන් තනතුර හඳුන්වා දෙනු ලැබුයේ පහත කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ද?

i. 1931 ඩොනමෝර් ව්‍යවස්ථාවෙනි.
ii. 1947 සෝල්බරි ව්‍යවස්ථාවෙනි.
iii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.
iv. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.

22) එදිනෙදා ජිවිතයේ ගැටුම් සාමකාමිව නිරාකරණය කර ගැනීමේ වාසියක් නොවන්නේ

i. ජිවිත හානී වැළකීම.
ii. ආත්ම ගෞරවය සුරැකීම.
iii. ආර්ථික ස්ථාවරභාවයක් නැතිවීම.
iv. මානසික ආතතිය අවමවීම.

23) මානව සංහතියේ තමන්ට ලබාදිය හැකි උපරිමය තම ළමයාට ලබා දීම තේමාව කරගත් සංවිධානය වන්නේ.

i. ලෝක සෞඛ්‍ය සංවිධානය
ii. අන්තර්ජාතික මූල්‍ය අරමුදල
iii. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
iv. ලෝක බැංකුව

24) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තේරිපත්වන මන්ත්‍රීවරු සංඛ්‍යාව වන්නේ

i. 25 යි.
ii. 26 යි.
iii. 29 යි.
iv. 30 යි.

25) ගැටුම් නිරාකරණය සඳහා ප්‍රතිවිරුද්ධ පාර්ශව සමග සාකච්ඡා මගින් විසඳුම් කරා යොමුකර ගතහැකි වඩා පහසු ක්‍රමයක් වේ.

i. සමථකරණය
ii. විනිසීම
iii. බේරුම්කිරීම
iv. මැදිහත්කරණය

26) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රජය හා පෞද්ගලික යන දෙඅංශයම ක්‍රියා කරනු ලබන අර්ථ ක්‍රමය කුමක්ද?

i. සමාජවාදී
ii. ධනවාදී
iii. මිශ්‍ර
iv. ලිබරල්වාදී

27) වර්තමාන ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය සඳහා බලපා ඇති වැදගත්ම හේතුව කුමක්ද?

i. වෙළඳ සබඳතා පුළුල්වීම.
ii. විවිධ රටවල භූගෝලීය පිහිටීම.
iii. විශ්ව ගම්මානයක් බවට පත්වීම.
iv. සන්නිවේදනය දියුණුවීම.

28) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායක සභාව හැඳින්වූ නම වූයේ.

i. පාර්ලිමේන්තුව.
ii. ජාතික රාජ සභාව.
iii. රාජ්‍ය මන්ත්‍රණ සභාව.
iv. ද්විමණ්ඩල පාර්ලිමේන්තුව.

29) සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. බදුල්ල හා මොනරාගල
ii. අනුරාධපුරය හා පොලොන්නරුව
iii. රත්නපුරය හා කෑගල්ල
iv. ගාල්ල හා මාතර

30) ශ්‍රී ලංකාව මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කළේ පහත කුමන වර්ෂයේද?

i. 1931 ii. 1833 iii. 1924 iv. 1972

31) ඉස්ලාම් නීතියේ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ,

i. අල් -කුර් ආනය
ii. ඉජ්මා
iii. අල් හදිස්
iv. තේසවලාමෙයි නීතිය

32) විදේශ ආධාර සපයන අන්තර් ජාතික සංවිධානයක් වන්නේ,

i. අන්තර් ජාතික මූල්‍ය අරමුදල
ii. එක්සත් ජාතීන්ගේ සංවිධානය
iii. වොරසෝ සංවිධානය
iv. සාර්ක් සංවිධානය

33) සංවර්ධනය මැනීමට යොදා ගන්නා නූතන මිනුම් ක්‍රමයක් සඳහන් පිළිතුර තෝරන්න.

i. මානව සංවර්ධන දර්ශකය
ii. දළ ජාතික ආදායම
iii. දළ දේශිය ආදායම
iv. ඒක පුද්ගල ආදායම

34) පැරණි සිංහල අධිකරණ ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබූ විදේශිය ජාතිය වන්නේ,

i. ලන්දේසීන්
ii. ප්‍රංශවරුන්
iii. පෘතුගීසීන්
iv. ඉංග්‍රිසීන්

35) ජාත්‍යන්තර දේශපාලනය තුළ බලවත් රටවල් විසින් දුර්වල රටවලට බලපෑම් කිරීම සඳහා භාවිතා කරනු ලබන්නේ,

i. සංස්කෘතික සහයෝගය.
ii. ජාත්‍යන්තර වෙළෙඳාම.
iii. ආගමික චාරිත්‍රය.
iv. අධ්‍යාපන සංවර්ධනය.

36) පාරිසරික ගැටළු ඇතිවීම සඳහා හේතුවන ප්‍රධානතම සාධකය කුමක්ද?

i. නූගත්කම
ii. සම්පත් අධිපරිභෝජනය
iii. දුප්පත්කම
iv. නොදැනුවත්කම

37) වර්ථමානයේ අන්තර්ජාතික වෙළඳාම සිදුවන ප්‍රධාන ආකාරයක් වන්නේ,

i. බහුපාර්ශවික වෙළඳාමයි.
ii. ද්විපාර්ශික වෙළඳාමයි.
iii. අපනයන වෙළඳාමයි.
iv. ආනයන වෙළඳාමයි.

38) ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ,

i. එංගලන්තයේ ලන්ඩන් නුවර ය.
ii. ප්‍රංශයේ පැරිස් නුවර ය.
iii. ඇමෙරිකාවේ නිව්යෝර්ක් නුවර ය.
iv. ස්විස්ටර්ලන්තයේ ජිනිවා නුවර ය.

39) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය ලොවට ඉදිරිලත් කල වර්ෂය කුමක්ද?

i. 1945 ii. 1948 iii. 1956 iv. 1972

40) එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලනය කාර්යාලය වන්නේ,

i. ආරක්ෂක මණ්ඩලය
ii. මහලේකම් කාර්යාලය
iii. මහා මණ්ඩලය
iv. ආර්ථික හා සමාජ මණ්ඩලය

18597
2024-02-28
Learning Resource Center
De Mazenod College
Kandana

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1)

i. ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන නිර්ණායක දෙක නම් කරන්න.

ii. ඕනෑම ආර්ථිකයක් මුහුණපාන ආර්ථික ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.

iii. දේශපාලන පක්ෂ ක්‍රමවල ස්වරූප දෙකක් නම් කරන්න.

iv. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි ප්‍රධාන කොටස් දෙක ලියන්න.

v. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

vi. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකකට උදාහරණ දෙන්න.

vii. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදිය හැකි කොටස් දෙකක් ලියන්න.

viii. දේශීය කෘෂි ආර්ථිකය දියුණු කිරීමට වර්තමානයේ රජය ගෙන ඇති පියවර දෙකක් ලියන්න.

ix. මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානයට යොමු වූ පුද්ගල කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න.

x. එක්සත් ජාතීන්ගේ සංගමයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 02×10=20)

2) සමාජ හා ජීවන ක්‍රමයක් ලෙසද ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වැදගත් වේ.

i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. (a) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් ජන මාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 2)

(b) ඉන් එකකින් ජනමතය ගොඩනැගීම සඳහා උදව්වන ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 3)

3) අර්ථ ක්‍රමයකට තිබෙන සම්පත්වලින් අසීමිත වුවමනා ඉටුකර ගැනීමට යම් යම් ක්‍රමානුකූල විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කළයුතු වේ.

i. නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ක්‍රම ශිල්ප දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී උපයෝගී කරගන්නා නිෂ්පාදන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii. (a) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

(b) ගෝලීයකරණය නිසා ලංකාවට බලපා ඇති සෘණාත්මක බලපෑමක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

4) නීතිය යනු සමාජයේ පුද්ගලයන්ගේ බාහිර හැසිරීම් පාලනය කරන්නාවූ රීති පද්ධතියකි.

i. දේශීය නීතියේ පවතින ප්‍රභේද දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. මහාධිකරණය මගින් විභාග කරනු ලබන නඩු වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. (a) නීතියේ ආධිපත්‍යය සංකල්පයට අදාළ මූලධර්ම දෙකක් ලියන්න. (ලකුණු 2)

(ඉ) සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා සිදුවිය හැකි අවාසි දෙකක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

5) ඒකීය රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවේ පරිපාලන බලය ක්‍රියාත්මක වන්නේ මධ්‍යම ආණ්ඩුව යටතේය.

i. මධ්‍යම ආණ්ඩුව සකස් වී ඇති ප්‍රධාන පාලන කොටස් දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට බලය විමධ්‍යගත කිරීමට හේතු තුනක් ලියන්න. (ලකුණු 3)

iii. (a) පහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ව්‍යවස්ථාදායකයා හැඳින්වූ නම සඳහන් කරන්න.

- 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (ලකුණු 2)

(b) පළාත් සභාවක් සිය කාර්යයන් සඳහා මුදල් ලබාගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

6) පෘථිවි තලයේ වාසය කරන මිනිසා ඇතුළු සියලුම ජීවීන් මුහුණපා ඇති ගැටළුවකි පරිසර දූෂණය.

i. පාරිසරික ගැටළු පැන නැගීමට හේතුවන

(a) මිනිස් ක්‍රියාකාරකමක් හා

(b) ස්වාභාවික සංසද්ධියක් පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. බොහෝ රටවල් පරිසර සංරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හේතු තුනක් ලියන්න. (ලකුණු 3)

iii. රටක සංවර්ධන ක්‍රියාදාමයේදී තිරසාර සංවර්ධනයේ ඇති වැදගත්කම කෙටියෙන් පහදන්න. (ලකුණු 5)

7) මිනිසුන් ලෙස උපත ලැබූ සැම කෙනෙකුටම මානව ගරුත්වයෙන් හා සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතියක් ඇත.

i. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට පාසලේ දී ලැබෙන අයිතිවාසිකම් දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. යහපත් පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළයුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. (a) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

iv. (b) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් කඩවන එක් අවස්ථාවක් නම් කර, එසේ සිදුවීමට බලපාන හේතුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)